JAT Loyalty වැඩසටහනේ නියමයන් හා කොන්දේසි

1. ශ්‍රී ලංකාවේ පදිංචි වයස අවුරුදු 18 හෝ ඊට වැඩි තම ජාතික හැඳුනුම්පත යටතේ ලියාපදිංචි කරන ලද වලංගු ජංගම දුරකථන අංකයක් ඉදිරිපත්කොට එය පවත්වාගෙන යාමට හැකියාවක් ඇති සියලුම තැනැත්තන් මෙම වැඩසටහන යටතේ සාමාජිකයින් වීමට සුදුසුකම් ලබයි. එක් ජාතික හැඳුනුම්පතක් යටතේ වැඩසටහන සඳහා ලියාපදිංචි කළ හැක්කේ එක් සාමාජිකයෙකු පමණයි.

2. ප්‍රථමයෙන් SMS කරනු ලබන ජංගම දුරකථන අංකය මගින් වැඩසටහන සඳහා ලියාපදිංචි වීම හා සමාජිකයෙකු හදුනා ගැනීම සිදු කෙරේ. සමාගම මගින් ප්‍රකාශයට පත් කර ඇති අවම පොයින්ට්ස් ප්‍රමාණය උපයා ගත් පසු සාමාජිකයාගෙ විස්තර යෙදවුමට ඇතුලත් කරනු ලැබේ.

3. සමාගම මගින් ප්‍රකාශයට පත් කර ඇති නිශ්පාදන වලට අදාළව ලෝයල්ටි පොයින්ට්ස් ලබා දීම සිදු කෙරේ. 2026.10.01 වන දිනට පොයින්ට්ස් ලබාදීම පහත පරිදි සිදු වේ.

| | සෙයර්ලැක් වෝටර් බේස් | මාස්ටර්ස් ස්ටේන්/ ටොප් කෝට් | මාස්ටර්ස් ඕල් ඉන් වන් |
|---|---|---|---|
| 1L | 500 | 100 | |
| 2.5L | 1000 | | |
| 4L | 2000 | 400 | 150 |
| 5L/ 6L | 2000 | | |
| 25L | 5000 | | |

4. උපයා ගන්නා සෑම ලකුණක්ම රුපියල් 1 ට සමාන වන අතර සාමාජිකයෙකු සමාගම විසින් ප්‍රකාශයට පත් කර ඇති අවම ලකුණු ප්‍රමාණය උපයා ගත් පසු ඔහු/ඇය කොමර්ෂල් බැංකු ඉතිරිකිරීමේ ගිණුමක් විවෘත කිරීමට සුදුසුකම් ලබන අතර JAT අභ්‍යන්තර පාරිභෝගික තහවුරු කිරීමේ ක්‍රියාපටිපාටියට යටත්ව කොමර්ෂල් බැංකුවේ නියමයන් සහ කොන්දේසි වලට අනුකූලව කොමර්ෂල් බැංකු ඩෙබිඩ් කාඩ්පතක් ලබා ගැනීමට සුදුසුකම් ලබයි.

5. ගිණුම විවෘත කරන අවස්ථාවේදී, සාමාජිකයාට ඔහුගේ සමාජික ගිණුමේ උපයා ඇති ප්‍රසාද ලකුණු වලට සමාන ආරම්භක ගිණුම් ශේෂයක් (මුදල් වශයෙන්) බැර කරනු ඇත.

6. ආරම්භක ලකුණු ගිණුමට තැන්පත් කිරීමෙන් පසු සෑම සතියකම  උපයා ගන්නා ප්‍රසාද ලකුණු වලට සමාන මුදලක් ඊලඟ සතිය තුළ ව්‍යාපාරික ගණුදෙනු සිදුකරන පළමු දින පහළව ඇතුලත ලබා දී ඇති කොමර්ෂල් බැංකු ගිණුමට බැර කෙරෙනු ඇත.

7. JAT සමාගමේ සේවකයන්, සිල්ලර වෙළඳුන්, වෙළඳ සහායකයන් සහ බෙදාහරින්නන් මෙම වැඩසටහනට සහභාගීවීමට සුදුසුකම් නොලබයි.

8. දැනුම් දීමක් සහිතව හෝ රහිතව ලෝයල්ටි වැඩසටහනේ රීති, පොයින්ට්ස්, උපයා ගත් පොයින්ට්ස් ප්‍රමාණය අනුව නියම කරන ලද පාරිභෝගික මට්ටම් වෙනස් කිරීමට, සීමා කිරීමට, සුලු වශයෙන් වෙනස් කිරීමට හෝ අවලංගු කිරීමට JAT සමාගමට අයිතිය තිබේ. (ලකුණුවල වටිනාකමට හා ත්‍යාග ලබගැනීමට බලපෑමක් ඇති වුවද)

9. ලෝයල්ටි වැඩසටහනේ නිශ්පාදනවල ප්‍රසාද ලකුණු වටිනාකම කලින් දැනුම් දීමකින් තොරව වෙනස්කිරීමේ අයිතිය JAT සමාගම විසින් තවදුරටත් රඳවා තබා ගනු ලැබේ. (03 වන කාරණය බලන්න)

10. ලකුණු රැස් කිරීම වැඩසටහනේ රීතිවලට යටත්ව සිදු වේ. එක් එක් සාමාජිකයා හෝ සාමාජිකාව තම අයිතිවාසිකම්, වගකීම්, ලෝයල්ටි වැඩසටහනේ තත්ත්වය මෙන්ම ප්‍රසාද ලකුණු ඉපැයීම සඳහා වන ව්‍යුහය පිළිබඳ අවබෝධයක් ලබා ගැනීම උදෙසා වැඩසටහනේ රීති, තොරතුරු පත්‍රිකා සහ දැන්වීම් කියවා බැලීම සඳහා වගකීම දරනු ලබයි.

11. සෑම මූල්‍ය වර්ෂයක අවසාන දිනයේදී, ඊට පෙර මූල්‍ය වර්ෂය තුළ අවම මූලික ලකුණු ප්‍රමාණය උපයාගත් නමුත් ගිණුම සක්‍රිය නොකරන ලද පාරිභෝගිකයන්ගේ ප්‍රසාද ලකුණු අහෝසි කිරීම සිදු වේ. මෙය සිදු කිරීමට පෙර සෑම වර්ෂයකම දෙසැම්බර් 31 දින සිට කෙටි පණිවිඩ සහ ආයතනයේ විකුණුම් සහ තාක්ෂණ අංශය් මගින් පාරිභෝගිකයා දැනුවත් කිරීම සිදු කරනු ලබන අතර ගිණුම සක්‍රිය කිරීමට මාර්තු 31 වනතුරු මාස 3ක කාලයක් ලබා දේ. එයට අපොහොසත් වූ විට ඒ වන විට උපයා ගත් සියලු ප්‍රසාද ලකුණු අහෝසි කිරීමට සමාගමට අයිතිය පවතී.

12. යම් පාරිභෝගිකයෙකු/ සාමාජිකයෙකු ලෝයල්ටි වැඩසටහනින් යම් ඕනෑම විටකදී ඉවත් කිරීමට හෝ යම් පාරිභෝගිකයෙකුගේ/ සාමාජිකයෙකුගේ ලියාපදිංචිය අවලංගු කිරීමට JAT සමාගම විසින් සිය පරම අයිතිය තවදුරටත් රඳවා තබාගනියි.

13. යම් සාමාජිකයෙකුගේ සාමාජිකත්වය අත්හිටුවීම හෝ අවලංගු කිරීම සිදුකර තිබෙන අවස්ථාවකදී JAT ලෝයල්ටි ප්‍රසාද ලකුණු අවලංගු වන අතර එකී ප්‍රසාද ලකුණු සාමාජිකයාට ලබා ගැනීමට නොහැකි වේ.

14. එකතු කරගත් ප්‍රසාද ලකුණු වෙනත් ත්‍යාග සඳහා හුවමාරු කළ නොහැකි අතර ණය සඳහා ලබාදීම ද සිදු කළ නොහැක. තවද ප්‍රසාද ලකුණු වෙනත් සාමාජිකයන්ට පැවරීමද සිදු කළ නොහැක.

15. JAT සමාගම සිය පරම අභිමතය ප්‍රකාරව මෙම වැඩසටහන යම් ඕනෑම විටකදී අත්හිටුවීමට, අවලංගු කිරීමට හෝ අවසන් කිරීමට සිය අයිතිය තවදුරටත් රඳවා තබාගනු ලබන අතර සාමාජිකයා වෙත සාධාරණ වශයෙන් දැන්වීම ලබාදිය හැක.

16. ප්‍රදානය කරන කවරම වර්ගයක වුවද ත්‍යාග සම්බන්ධයෙන් හෝ නිදහස් කර ගැනීමට අවශ්‍ය වන JAT ලෝයල්ටි ප්‍රසාද ලකුණු සංඛ්‍යාව සම්බන්ධයෙන් වෙනසක් කිරීමට JAT සමාගමට සිය අයිතිය පවතී. එවැනි යම් වෙනසක් සමාගමේ වෙබ් අඩවියේ දක්වනු ලැබේ.

17. සක්‍රිය කරන ලද , JAT කොමර්ෂල් බැංකු ලොයල්ටි ඩෙබිඩ් කාඩ්පත කල් ඉකුත් වුවහොත්, සොරකම් කළහොත් හෝ නැති වුවහොත් ඒ බව හැකි ඉක්මනින් බැංකුව වෙත දැනුම් දී නව කාඩ් පතක් ලබා ගැනීම සාමාජිකයාගේ වගකීම විය යුතුය. අලුත් කාඩ්පතක් නිකුත් කිරීමේ වියදම සාමාජිකයා විසින් දැරිය යුතුය.

18. පාරිභෝගිකයා විසින් ලබා ගන්නා ලද බැංකු කාඩ්පත සක්‍රිය නොකර ළඟ තබා ගැනීමෙන් කල් ඉකුත් වීමකට ලක් වී ඇති අවස්ථාවන්වලදී හා අස්ථානගත වීමකදී පාරිභෝගිකයා නැවත කාඩ්පතක් ලබා ගැනීමට බලාපොරොත්තු වන්නේ නම් ප්‍රසාද ලකුණු 10,000ක් අලුතින්ම උපයා ගැනීම සිදු කර ගත යුතුය.

19. යම් සාමාජිකයකු විසින් බැංකුවට අසත්‍ය තොරතුරු ලබාදීම නිසා බැංකුව විසින් කරන යම් කවරම වූ හිමිකම්පෑම්වලට එරෙහිව සාමාජිකයන් විසින් JAT සමාගමට හානිපූර්ණය කිරීමට මෙයින් එකඟ වේ.

20. යම් තුන්වන පාර්ශවයක් JAT සමාගමට එරෙහිව කරන යම් කවරම වූ හිමිකම්පෑම්වලට එරෙහිව සාමාජිකයන් විසින් JAT සමාගමට හානිපූර්ණය කිරීමට මෙයින් එකඟ වේ.

21. එක් සාමාජිකයෙකුට කේත එවීම සඳහා උපරිම වශයෙන් සක්‍රිය තත්වයේ පවත්වා ගත හැක්කේ දුරකථන අංක දෙකක් පමණි. සාමාජිකයාගේ අභිමතය පරිදි අක්‍රිය තත්වයට පත් කරන ලද දුරකථන අංක මගින් නැවත කේත එවීම සිදු වුවහොත් එම ප්‍රසාද ලකුණු අවලංගු කිරීමට JAT සමාගමට අයිතිය ඇත.

22. විකෘති හෝ පලුදු වූ කේත සඳහා රහස් කේතය ලබා දීම වෙළඳ නියෝජිතයෙකුගේ තහවුරු කිරීම මත පමණක් සිදු වේ.

23. JAT ලෝයල්ටි වැඩසටහනෙහි ප්‍රධාන සමබන්ධීකරණ දුරකථන අංකය වන්නේ 0117524150.